sinhalaebooks.com

# ආශ්චර්යමත් රුවන්වැලි සෑය ප්‍රතිසංස්කරණ පින්කම



sinhalaebooks.com



sinhalaebooks.com

# 1. චෛත්‍ය තැනීමට දයකත්වය ලබාදීමේ ආනිසංස.

මේ කාලසීමාවේදී ලංකාද්වීපයේ ස්ථාන කිහිපයකම ලොව්තුරා අංගීරස වූ සම්මා සම්බුදුරජානන් වහන්සේ උදෙසා මහා ස්ථූපයන් ගොඩනැංවෙමින් පවතිනවා. අප මේ ස්ථූප තැනීමේදී දායකත්වය ලබාදෙන විට අපගේ සිතේ, මා මේ තථාගතයන් වහන්සේ ගේ ධාතූන් වහන්සේලා උදෙසායි මේ පින්කම කරන්නේ. එහෙමත් නැත්නම් ඒ ශ්‍රාවක උතුමන් වහන්සේ උදෙසායැයි මේ ස්ථූපයට උදව් උපකාර කරන්නේ කියන අදහසින් කරනවා නම් ඒ තුළින් අපට අප්‍රමාණ ප්‍රන්‍යස්කන්ධයක් රැස් වෙනවා.

මේ ගැන විශේෂ තොරතුරු ඛුද්දක නිකායට අයත් අප දාන පාලියේ සඳහන් වෙනවා. ගෞතම බුදු සසුනේ නෙකෙළෙස් වූ උතුම් රහතුන් වහන්සේලා අතීතයේ උන්වහන්සේලා ගේ ජීවිත ගතකළ ආකාරය. උන්වහන්සේලා කල්ප ගණනක් ආපස්සට අතීතය දැකලා පෙන්වා දෙනවා මම අතීතයේදී ස්ථූප රාජයාණන් වහන්සේට චක්‍රයක් පූජා කළා, වස්ත්‍රයක් පූජා කළා.

එයින් රැස් වූ පුණ්‍යස්කන්ධයේ විපාකයක් ලෙස මේ ආකාරයට දුගතියේ නොයා බොහෝ කාලයක් සුගතියේ ඉපදිලා පසුකලකදී බුදු සසුනේ උතුම් ධර්මාවබෝධය ලැබීමට පවා ඒ පින හේතු වූ බව. එනිසා ස්ථූපයකට මොනයම් අයුරින් හෝ දායකත්වය ලබාදෙන සැදැවතුන්ට බොහෝ පින් එක්රැස් වෙනවා. එපමණක් නොවේ තැනූ චෛත්‍යරාජයාණන් වහන්සේ නමක් කෙනෙක් දැකබලා සිත පහදවා ගෙන වන්දනා මාන කළද එයින් බොහෝ පින් එකතු වෙනවා.

ඒ පිළිබඳව ඛුද්දක නිකායට අයත් විමාන වත්ථු හි සඳහන් වෙනවා එක්තරා ස්ත්‍රියක් වැටකොලු මල් හතරක් ධාතු ස්ථූපයකට පූජා කරන්නට යද්දී ගව දෙනක්ගේ පහර කා මරණයට පත්වෙලා ඒ මොහොතේදීම තවුතිසා දිව්‍ය ලෝකයේ උපත ලබනවා. ස්වර්ණ වර්ණ වූ සියලු ආභරණ ඒ වගේම සියලු වස්ත්‍ර සහිතව සෝබමාන සිරුරකින් යුතුවයි එහි ඉපදුනේ. ඇයගේ සැප සම්පත් දැකලා ශක්‍ර දේවේන්ද්‍රයා ඒ ගැන විමසද්දී ඒ දෙව්දුව පැවසුවේ තථාගතයන් වහන්සේ ගේ ධාතු ස්ථූපයකට වැටකොලු මල් පූජා කරන්න යද්දී තමයි කලුරිය කළේ.

ඒ තුළින් රැස් වූ ප්‍රන්‍ය විපාක තමයි අත් විඳින්නේ කියලා. එසේ පින් ඵලදෙන ආකාරය විමාන වත්ථු පාලියේ පැහැදිලිව සටහන් වී තිබෙනවා. එහි තැනක සඳහන් වෙනවා "ආගැබ් වහන්සේලාට, ගුණවත් සංඝයාට, ආගන්තුකයන්ට, මව්පියන්ට, වැඩිමහළු පිරිසට දන්දීමේ ගෞරව කිරීම් ආදිය කරනවා නම් මේ පුන්‍ය නිධානය කාටවත් සොරකම් කරන්න බෑ කියලා. පරලොව යද්දී එය තමාගේ පස්සෙන්ම එනවා. දෙව් මිනිසුන්ට තමන් කැමති කැමති හැම තැනම ලබා දෙන්නේ මේ පුන්‍ය නිධානයෙන් බව. ඔබ ස්ථූපයක් තැනීමට උදව් උපකාර කළ පින මේ ථේරපදානයන් කියවා මෙසේ තේරුම් ගන්න.

sinhalaebooks.com



sinhalaebooks.com

## 01. පභංකර ථේරාපදානය

පදුමුත්තර බුදුරජුන්ගේ ස්ථූපයක් චණ්ඩ මෘගයන්ගෙන් ගැවසී ගත් මහා වනයෙහි විය. චෛත්‍යය වඳිනු සඳහා යාමට කිසිවෙක් සමත් නොවීය. එම චෛත්‍යය තණ, දර, ලිය වෙලුනු බිඳී ගිය එකක් විය. මම වනයේ කටයුතු කරන වන කාර්මිකයෙක් වීමි. මම එම බුදුරජුන්ගේ ධාතු නිදන් කළ සෑය දැක, ඒ කෙරෙහි ගෞරව චිත්තයක් ඉපිදවීමි. බුද්ධ ශ්‍රේෂ්ඨයන් වයහන්සේගේ මෙම ස්ථූපය පිරිසිදු නොකර අන් කටයුතු වල යෙදෙන්නේ නම්, එය නුදුසුදුයි සිතා මම චෛත්‍යයෙහි වූ කොළද, දරද, වැල්ද, පිරිසිදු කොට ගලවා දමා අටවරක් නැවුණේ, උක්කුටියෙන් හිඳ වැඳ ගියෙමි. මැනවින් කරන ලද එම කර්මය කරණ කොට ගෙනද චිත්ත ප්‍රීතියෙන් කළ පැතුම කරණ කොට ගෙනද මම මිනිස් සිරුර හැර තව්තිසා දෙව්ලොව උපත ලැබුවෙමි. එහි මට මැනවින් කරන ලද විමානය රුවන්මුවාය. පැහැ විහිදෙන්නේය. සැට යොදුන් උසය. තිස් යොදුන් පළලය. මම තෙසිය වරක් දිව්‍ය රාජ්‍ය කරවීමි. පස්විසි වරක් සක්විති රජවීමි.

මම කුදු මහත් භවයන්හි සැරිසරමින් මහත් භෝග ලැබීමි. මාගේ භෝග සම්පත්තියෙහි අඩු බවක් නම් නැත. චෛත්‍යය පිරිසිදු කිරීමේ විපාකයයි මේ. දෝලාවකින් හෝ ඇතුපිටින් වනයෙහි ගමන් කරන්නා වූ මට එහි යම් යම් දිශාවකට ගමන් කළෙම්ද වනයම මට පිහිට ඇතිකරයි. එසේ යන කල්හි කණුවක් හෝ කටුවක් හෝ මම ඇසින් නොදකිමි. චෛත්‍ය පිරිසිදු කිරීමේ විපාකයෙන් එම කණු කටු තෙමේම ඉවත් වෙයි. කුෂ්ඨද සිරුරෙහි හැදෙන ගඩ ගෙඩිද, කිලාසනම් කුෂ්ඨ විශේෂයද, අපස්මාරයද, මීමැස්මොරයද, විතච්ඡිකානම් කුෂ්ඨද, දද ද, කැසිලි ද මට නැත. චෛත්‍යය පිරිසිදු කිරීමේ විපාකයයි මේ.


බුදුරජුන්ගේ ධාතු නිදන්කළ සෑය පිරිසිදු කිරීමෙහි මට ලැබුණු අනෙක් ආශ්චර්යයක්ද වෙයි. එනම් මාගේ සිරුරෙහි, හටගත්තා වූ ස්වල්ප මාත්‍රවූ ද බිබිලක්ද නොදකිමි. බුදුරජුන්ගේ ධාතු නිදන්කළ සෑය පිරිසිදු කිරීමෙහි මට ලැබුණු අනෙක් ආශ්චර්යයක්ද වෙයි. එනම් දිව්‍ය වූද මනුෂ්‍ය වූද භව දෙකෙහි පමණක් සැරි සැරුවෙමි.බුදුරජුන්ගේ ධාතු නිදන්කළ සෑය පිරිසිදු කිරීමෙහි මට ලැබුණු අනෙක් ආශ්චර්යයක්ද වෙයි. එනම් මම හැම තන්හි රුවන්වන් වූයේද පැහැ පත් වූයේ ද වෙමි. බුදුරජුන්ගේ ධාතු නිධන්කල සෑය පිරිසිදු කිරීමෙහි මට ලැබුණු අනෙක් ආශ්චර්යයක්ද වෙයි. එනම් මා නොකැමති දෑ බැහැරවෙයි. කැමති දෑ එළැඹසිටි.

බුදුරජුන්ගේ ධාතු නිධන්කල සෑය පිරිසිදු කිරීමෙහි මට ලැබුණු අනෙක් ආශ්චර්යයක්ද වෙයි. එනම් මා ගේ සිත එකඟ වූ මැනවින් සමාධියට පත්වූ පිරිසිදු එකක් වේ. බුදුරජුන්ගේ ධාතු නිදන්කළ සෑය පිරිසිදු කිරීමෙහි මට ලැබුණු අනෙක් ආශ්චර්යයක්ද වෙයි. එනම් එක අසුනෙහිම හිඳ රහත් බවට පැමිණියෙමි. මින් සියක් දහස් ලක්ෂයක් වන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කලෙම් ද ඒ හේතුවෙන් දුගතියට නොගියෙමි. මේ සෑය පිරිසිදු කිරීමෙහි විපාකයයි.

sinhalaebooks.com

## 02. නාගසමාල ථේරාපදානය

මම සියලු නගර වාසීන්ගේ වැඳුම් පිදුම් සඳහා නගර මැද වීදියෙහි සුණු ගඩොල් ආදියෙන් නිමවන ලද සිඛී බුදුරජුන්ගේ ස්තූපයට ආදර සිරතව පලෝ මලක් ගෙන තැබීමි. මින් එක්තිස්වන කපෙහි වූ, එකල්හි යම් පුණ්‍යකර්මයක් කලෙම්ද ඒ හේතුවෙන් දුගතියට නොගියෙමි. මේ ස්ථූප පූජාවෙහි විපාකයයි. මින් පසෙලොස්වන කපෙහි සත් රුවනින් යුත් මහත් බල ඇති "භූමීය" නම් සක්විති රජෙක් වීමි. මේ ජීවිතයේදී සිව් පිළිසිඹියාවෝද අෂ්ඨ විමෝක්ෂයෝද ෂඩ් අභිඥාවෝද සාක්ෂාත් කරන ලදී. බුදු රජාණන් වහන්සේගේ සසුන සම්පූර්ණ කරන ලදී. මේ අයුරින් ආයුෂ්මත් නාගසමාල තෙරුන් වහන්සේ මෙම ගාථාවන් වදාළ සේක.



sinhalaebooks.com

## 03. සුධා පිණ්ඩිය ථේරාපදානය

සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේගේ සෑයට මා විසින් පැහැදුනු සිතින් සුණු පිඬක් දෙන ලදී. එයින් සෑය පිළිසකර කෙරිණි. මින් සිව් අනූවන කපෙහි වූ එකල්හි යම් පින් කමක් කලෙම්ද ඒ හේතුවෙන් දුගතියට නොගියෙමි. සෑ පිළිසකරෙහි ප්‍රතිසංස්කරණයෙහි විපාකයයි මේ.
මින් තිස්වන කපෙහි සත් රුවනින් යුත් “පටිසංඛාර” නම් වූ සක්විති රජ කෙනෙක් වීමි. මේ ජීවිතයේදී සිව් පිළිසිඹියාවෝද, අෂ්ඨ විමෝක්ෂයෝද, ෂඩ් අභිඥාවෝද සාක්ෂාත් කරන ලදී. බුදු රජාණන් වහන්සේගේ සසුන සම්පූර්ණ කරන ලදී. මේ අයුරින් ආයුෂ්මත් සුධා පිණ්ඩිය තෙරුන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

## 04. සපරිවාරිය ථේරාපදානය

පදුමුත්තර බුදුරජාණන් වහන්සේ පිරිනිවි කල්හි උන්වහන්සේගේ ධාතු නිදන් කල මහත් සෑයක් විය. මම අති උතුම් ධාතු ගර්භයෙහි දිව රෑ දෙක්හි උවටැන් කලෙමි. පහන් සිත් ඇතිව, සොම්නස් ඇතිව එහි සඳුන් වේදිකාවක්ද කලෙමි. මේ පුණ්‍ය කර්මයේ විපාකයෙන් දිව්‍ය වූ හෝ මානුෂීය වූ හෝ භවයෙහි උපදින කල්හි මාගේ පහත් බවක් නොවීය. මේ පූර්ව කර්මයේ මින් එක් දහස් පන්සිය වන කපෙහි මහත් බල ඇති “සමත්ත” නම් වූ ඒ සියලු සක්විති රජවරු අට දෙනෙක් වූහ.

## 05. පිළින්දවච්ඡ ථේරාපදානය

සුමේධ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ කල්හි පහන් සිත් ඇති සොම්නස් වූ මම ස්ථූප පූජාවක් කළෙමි. එම ථූප පූජා කිරීම් වශයෙන් ඇතිවූ චිත්ත ප්‍රසාදය කරණ කොටගෙන මම දිව්‍ය විමානයක උපනිමි. අසූ දහසක් දෙවඟනෝ මාගේ සිත සතුටු කරවූහ. එම අප්සරාවෝ සියලු කාමයන් කරණ කොටගෙන මා අනුවම පවතිත්, මම අනෙක් දෙවියන් සම්පත්තියෙන් ඉක්ම වීමි. මේ ස්ථූප පූජා පුණ්‍යකර්මයාගේ විපාකයයි. මම එකල්හි පස් විසිවන කපෙහි පිරිසිදු බොජුන් ඇති “වරුණ” නම් සක්විති රජෙක් වීමි. මම එහි රාජ්‍ය කොට නැවත දිව්‍ය ආත්මභාවයට පැමිණියෙමි. එකල්හි ද මට මෙබඳුම වූ භෝග සම්පත්ති තොමෝ උපන්නය. මිතුරු වූ හෝ පසමිතුරු වූ හෝ සියලු ප්‍රාණීහු මට හිංසා නොකෙරෙත්. මම සියලු දෙනාටම ප්‍රිය වීමි.. මේ ස්ථූප පූජා පුණ්‍යකර්මයාගේ විපාකයයි. මේ භද්‍ර කල්පයේ මම මහානුභාව ඇති මහත් බල ඇති එක් සක්විති රජෙක් වීමි

sinhalaebooks.com



sinhalaebooks.com

# 2. දුටුගැමුණු නිරිඳුන්ගේ මහා පෞරුෂය පෙන්වා මහා සෑය යළි ගොඩනැඟූ මහා යතිවරයාණෝ

## 2.1 සියවස් හයක් තිස්සෙ ගරා වැටුණු සෑය


රුවන්මැලි සෑය නටබුන්ව යෑමට හේතු වූයේ රජරටට එල්ල වූ පරසතුරු ආක්‍රමණයි. ක්‍රිස්තු වර්ෂ 1215 දී රජරටට එල්ල වූ කාලිංග මාඝගේ ආක්‍රමණයේ ප්‍රතිඵලය වූයේ සිංහල පාලකයන් හා ජනතාව ජීවිතාරක්ෂාව පතා දිවයිනේ නිරිත දිග හා අනෙකුත් ප්‍රදේශවලට පලා යෑමය. එසේ පලාගිය පිරිස් අතරින් 3 වන විජයබාහු 1232දී දඹදෙණි රාජධානිය ආරම්භ කළේය. එතුමාගේ පුත් දෙවන පරාක්‍රමබාහු රජතුමා විසින් 1255 දී රජරටින් මාඝ එළවා දැමීමෙන් පසු ආරක්ෂක හේතු මත නැවත අනුරාධපුරය හෝ පොලොන්නරුව රාජ්‍ය මධ්‍යස්ථානය බවට පත් කර නොගැනීම නිසා රජරට වන වැදී ජන ශූන්‍ය වීම ඇරඹිණි. එහෙයින් අනුරාධපුර රාජධානි සමයේ දී එහි ඉදිවූ මහා ස්තූප ඇතුළත් මහා විහාර පිළිසරණක් නැතිව නටබුන් වී මහ වනයෙන් වෙළී ගියේය.

මේ තත්ත්වය යටතේ අනුරාධපුරයේ තරමක් හෝ එළිපෙහෙළිව තිබුණේ ශ්‍රී මහා බෝධිය අවට භූමි ප්‍රදේශය පමණ ය. මහනුවර රාජධානි සමයේ අනුරාධපුරය ඇතුළත් නුවරකලාවිය උඩරට පාලනය යටතේ තිබුණ අතර 1815 ඉංග්‍රීසින්ට උඩරට යටත් වීමත් සමගම නුවරකලාවිය ද ඉංග්‍රීසින්ට අයත් විය. ඒ අනුව ඉංග්‍රීසින් නුවරකලාවිය පාලනය සඳහා ඔවුන්ගේ කාර්යාල හා නවාතැන් සාදා ගත්තේ එසේ තරමක් හෝ එළිපෙහෙළිව තිබූ ශ්‍රී මහා බෝධිය අවට භූමියේ ය. අනුරාධපුරය අදත් සිංහලයාගේ ශුද්ධ නගරය ය. මේ මහා නගරය සහමුලින් වැනසී නටබුන් වන්නේ අදින් වසර 1024ක් ඈත අතීතයේදීය. ඓතිහාසික ලෝකයේ මහත් සම්භාවනාවට ලක්වෙමින් පුරා වසර 1373 ක් තිස්සේ රජවරුන් 124 දෙනෙකු විසින් හොබවන ලද මේ කීර්තිමත් නගරය අපේ ඉතිහාසයේ අඩකට ආසන්න කාලයක් පැවතියේ මලවුන්ගේ නරගයක් ලෙසය. ඒ ඉසුරුමත් පුරය මළගෙයක් කරන මහා ඓතිහාසික කොල්ලය සිදුවන්නේ ක්‍රිස්තු වර්ෂ 993 දීය. බිහිසුණු ආක්‍රමණයක යෙදුණු චෝල හමුදා ඒ කොල්ලයත් සමග සිංහලයේ ගෞරවාන්විත යුගය නිමා කළේය. ඔවුහු අනුරාධපුර නගරය තිරශ්චීන ලෙස කොල්ල කෑහ. රටක් කොල්ලකෑ හැකි බිහිසුණුම ආකාරයට ඔවුහු ඒ කොල්ලයේ යෙදුණහ.

එවකට අනුරාධපුරයේ පාලකයාව සිටියේ පස්වන මිහිඳු (ක්‍රි.ව.982-1029) රජුය. සොළීහු පස්වන මිහිඳු ජීවග්‍රහයෙන් ගත්හ. ඔහුගේ බිසවත් ජීවග්‍රහයෙන් ගත්හ. ලක්දිව පාරම්පරික ඔටුන්නත්, රාජ්‍යත්වය සංකේතවත් කළ පංච කකුධ භාණ්ඩ ඇතුළු සියලූ රාජකීය ආභරණත්, මිල කළ නොහැකි තරම් අගනා වජ්‍රයත්, බිඳිය නොහැකි සිරිය හා නළල්පටත් සහිතව ජීවග්‍රහයෙන් ගත් රජු හා බිසව ඉන්දියානු චෝල මණ්ඩලයේ චෝල රජු වෙත යැවූහ. අනුරාධපුර යුගය අවසන් කරන පස්වන මිහිඳු සොළී රටේ දී ( ක්‍රි.ව.1029) දුගී යාචකයෙක් බඳු සිරකරුවෙකු ලෙස මියගියේය. ඉන් අනතුරුව සොළීහු රජරට අමුසොහොනක් කළහ. මේ නිර්දය කොල්ලයෙන් අනතුරුව බිඳ දැමුණු දාගැබ් වෙහෙර විහාර සොහොන් සේ පාළුවට ගියේය. වාරි කර්මාන්ත නටබුන්ව ගියේය. අනුරාධපුර අත්හළ නරගරයක් බවට පත්විය. මේ අවාසනාවන්ත අත්හැරීමෙන් අනතුරුව පොලොන්නරුවට විතැන්වන සිංහලයේ රාජධානිය ගලින් ගලට, කන්දෙන් කන්දට, වගුරු බිම් හරහා නිරිත දිගට මාරු වී අවසානයේ දී කන්ද උඩරටින් ස්වකීය කතාව නිමා කළේය.

sinhalaebooks.com

ඉංග්‍රීසි පාලන සමයේ අනුරාධපුර ප්‍රදේශයේ විසූ ඉංග්‍රීසි ජාතික ඒජන්තවරුන්ගේ වාර්තාවල ද දැක්වෙන පරිදි අනුරපුර පූජානගරයේ චෛත්‍ය කුඩා කඳු ගැට ලෙසයි, දිස්ව ඇත්තේ. එමෙන්ම ඒවා තුරුලතා වලින් වැසී තිබිණි....




sinhalaebooks.com

සකල ලෝකවාසී බෞද්ධයන් අතර අනුරාධපුර රුවන්මැලි සෑය අති පූජනීය සිද්ධස්ථානයක් ලෙස සැලකෙන්නේ එහි ශ්‍රී සර්වඥ ධාතු ද්‍රෝණයක් පමණ නිදන් කර ඇති නිසාත් අට්ඨකථාවල සඳහන් පරිදි සර්වඥ ධාතු වන්දනය සර්වඥයන් වහන්සේ වැඳීම පිදීම හා සමාන වන බවත් නිසා ය. රුවන්මැලි සෑයට විවිධ පුද පූජා පැවැත්වූ හෝ පිළිසකර කිරීම් කළ විවිධ පාලකකාරකාදීන් ගැන වංශකථාවලින් හා ශිලාලිපිවලන් විශාල තොරතුරු ප්‍රමාණයක් ලැබේ. එහෙත් පොදු ජන විඥානයේ ඇඩිව රැඳී ඇත්තේ සෑය ඉදි කළ දුටුගැමුණු මහ රජතුමා සහ පරසතුරු උවදුරු නිසා වසර හය හත්සියයක් නටබුන්ව වන වැදී තිබූ එම සෑය අද වන විට සැදැහවතුන්ට වඳින්නට පුදන්නට අවැසි පරිදි දැවැන්ත සංරක්ෂණය ආරම්භ කළ යතිවරයාණන් වන නාරංවිට සුමනසාර හිමිය.

ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය ඇරඹීමත් සමග ලංකාව පුරා සංචාරය කළ ඉංගී්‍රසීන් අතුරින්, අනුරාධපුර ප්‍රදේශයේ සංචාරය කළවුන් දුටුවේ වනයෙන් වැසී ගොස් තිබූ අතීත ලාංකිකයන් විසින් නිර්මාණය කරනු ලැබූ යෝධ ආගමික ස්මාරක රාශියකි. රුවන්මැලි සෑය ඒ වන විට වනයෙන් වැසීගොස් තිබුණ ද, එය හඳුනාගත හැකි අන්දමට පැවති බව පෙනීයන්නේ අනුරාධපුරයේ සංචාරයක යෙදුණු ඉංගී්‍රසි ජාතික ශ්‍රීමත් එමර්සන් ටෙනන්ට් සටහනකට අනුව ය. වර්ෂ 1830 දී අඩි 189 ක් පමණ වූ සෑයේ උස 1850 දශකය ආරම්භ වන අඩි 150 දක්වා අඩු වී සෑය ගරාවැටී තිබූ බව ටෙනන්ට් වැඩිදුරටත් සඳහන් කරයි.

එවන් පසුබිමක 1870 දශකය ආරම්භයේදී ගම්පොළ ප්‍රදේශයේ සිට අනුරාධපුර පූජා නගරයට වන්දනාවේ පැමිණි නාරංවිට සුමනසාර නම් භික්ෂූන් වහන්සේලා වල් බිහිව පැවති රුවන්මැලිසෑය දැක අදිටන් කරගත්තේ නැවතත් එය පැරණි තත්ත්වයටම පිළිසකර කිරීමට ය. මීට පෙර අවස්ථා කීපයකදීම රුවන්මැලි සෑයේ ප්‍රතිසංස්කරණ කටයුතු සුළු වශයෙන් සිදුව තිබුණු අතර ඉන් වැදගත් වන්නේ වර්ෂ 1835 දී සිදුකරනු ලැබූ සුළු ප්‍රතිසංස්කරණ කටයුත්ත පමණි. වර්ෂ 1872 පටන් රුවන්මැලිසෑයේ භාරකාරීත්වය පැවරුණේ විසිතුන් වන වියේ පසු වූ සුමනසාර හිමියන්ට ය. එවකට අබෞද්ධ බලය පැතිර තිබූ අනුරාධපුරයේ කිසිදු බාධාවකින් තොරව කටයුතු කිරීමට උන්වහන්සේට හැකිවූයේ හැඩි දැඩි සිරුරක් තිබූ නිසා බව කියැවෙන අතර වර්ෂ 1873 දී සුමනසාර හිමියන් රුවන්මැලි සෑයේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කළේ අසල නවතා තිබූ කරත්තයක අඹරාවක් යට රාත්‍රිය ගත කරමිනි.

sinhalaebooks.com



sinhalaebooks.com

## 2.2 ඉංග්‍රීසින් දුටු අනුරාධපුරය

මේ මහා අත්හැරීමෙන් අනතුරුව අනුරාධපුරයේ ගොඩනැගිලි ප්‍රකෘතිමත් කිරීමේ ප්‍රයත්නයක් මහා විජයබාවන්, මහා පැරකුම්බාවන් හා නිශ්ශංකමල්ල විසින් දරා තිබිණි. දඹදෙණියේ දෙවන පරාක්‍රමබාහු රජුගේ පුත් තුන්වන විජයබාහු (ක්‍රි.ව.1270-72) අතර අනුරාධපුරයේ සුළු ප්‍රතිසංස්කරණ කරවීය. අනතුරුව මේ මහා නුවර සියවස් අටක් තිස්සේ මනුෂ්‍යාවාසයකින් තොර රුදු වනදහනෙහි සැඟව ගියේය. යළි ඒ නුවර සම්බන්ධ ප්‍රාමාණාත්මක අවධානයක් යොමු වන්නේ 19 වැනි සියවස මැද භාගයේ ඉංග්‍රීසි පාලනය යටතේය.

රටේ සිදුවූ මහා ව්‍යසනයන් අතර ලෝකයෙන් හුදකලාව ගම්කොටුවල වසමින් හේනක වවාගත් කටුසර භෝගයකින් යැපෙමින්, වැව් කොටුවක එක් කරගත් දිය ඩිංගිත්තකින් මඩ ගොවිතැනක් කරමින්, සොබාදහම විසින් තළා පොඩි කර දමනතුරු නිහඬව ජීවත්වූ මනුෂ්‍යයෝ පිරිසක් රජරට වූහ. අනුරාධපුරය සිරිමා හාමුදුරුවන් අලින්ගෙන් රක්ෂා කරගැනීම සඳහා නිකිණි පොහොයට දරමිටි බැඳගෙන අනුරාධපුරයට පැමිණියෝ මේ මිනිස්සුය. නිදිවරාගෙන ගිනිමැල පත්තුකළේ මේ මිනිස්සුය. මහා රාජවරු මුළුමනින්ම අත්හළත් සිරිමා හාමුදුරුවන් අත් නොහැර උන්වහන්සේ වෙනුවෙන් ජීවත්වූයේ මේ මිනිස්සුය. වැලිවිට සිරි සරණංකර සංඝරාජ හිමියන් ලවා කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ අවධානය ගෙන ජයශ්‍රී මහා බෝධිය රක්ෂා කරගැනීම සඳහා හාත්පස ඇති නටබුන් ගල් කණුවලින් ප්‍රාකාරයක් කරගත්තෝ මේ මිනිස්සු ය. තමන්ගේ ශක්තියෙන් ගොඩගැනීමට නොපොහොනා මහා ස්තූප කරා වන මැදින් වට අඩිපාර දිගේ ගොස් මලක් පහනක් පූජා කළෝ මේ මිනිස්සුය.

මේ මිනිස්සුන්ගේ ජීවිත වර්ෂ එක්දහස් අටසීයේ මුල් දශකවල සිටි ඉංග්‍රීසි පාලකයෝ වාර්තා කළහ. මේ ප්‍රදේශයේ පරිපාලන පහසුව තකා වර්ෂ 1833 දී පිහිටුවන ලද නුවර කලාවිය පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පරිපාලන මූලස්ථානයක් අනුරාධපුරයේ තනා ගැනීමට ඉංග්‍රීසීන්ට අවශ්‍ය විය. ඒ කාලයේ එවන් ස්ථානයක් පවත්වාගැනීමට සුදුසු වන ප්‍රවාහයෙන් යට නොවුණු බිම්කඩක් අනුරාධපුරයේ නොවුණු ආකාරය ආර්.ඩබ්ලියු අයිවර්ස් අතීත ලේඛන උපුටා දක්වමින් සිය Manual of the North Central Province ලේඛනයේ සඳහන් කර තිබිණි. එම වාර්තා ප්‍රකාරව ඒ වනවිට අනුරාධපුරයේ දී සමාජ ඇසුරක් සහිතව එළි පෙහෙළි වී තිබූ එකම බිම වූයේ ජය ශ්‍රී මහාබෝධියට නුදුරින් වන මහා නුගරුක ප්‍රදේශයය. ඔවුහු එහි තම කච්චේරිය පිහිටුවා ගත්හ. (ලෝවා මහාපායට නුදුරුව පිහිටි චතුශ්ශාලා ආන ශාලාව අසල තවමත් ඒ ඉදිකිරීම දක්නට ඇත්තේය.)

ඉංග්‍රීසි ජාතිකයන් ස්වකීය වාර්තාවලින් හෙළි කරනු ලැබුවේ මහා සංස්කෘතියක මලගමය. වර්ෂ 1832 දී ඉංග්‍රී ආණ්ඩුවේ බෙනට් නම් නිළධාරියා "ලංකාව" නමැති පොතේ දක්වන ආකාරයට "අනුරාධපුරය පැවතුනේ ඊට යාන්තම් ගමක් යැයි නම් කිරීමටත් නොසුදුසු" මට්ටමිනි. අනුරාධපුරය ගැන මුල්ම සවිස්තරාත්මක නිරීක්ෂණ සහිත වාර්තාව ඉදිරිපත්කළ මේජර් ස්කිනර් මේ නගරය කාන්තාරයක් මැද පිහිටි පුංචි ගමක් සේ දුටුවේය. වර්ෂ 1863 වනවිට ලෝවාමහාපාය වසාගෙන පැවැති මහා වනදහනේ සිටි මුවන් කච්චේරියේ ආලින්දයේ සිට දඩයම් කිරීමට එවකට සිටි ආණ්ඩුවේ සහකාර ඒජන්තවරයාට හැකිවිය. මේ විභූතිමත් අතීත මහා නගරය මලවුන්ගේ නගරයක් වී ඇති අයුරු එල්.සී. ලීසිං නම් ඒජනතවරයා 1866 දී කම්පනයකින් යුතුව ලියා තැබුවේය.

sinhalaebooks.com



sinhalaebooks.com

## 2.3 වන්දනාව

එහෙත් මේ මළඋන්ගේ නගරය සැදැහැවත් සිංහල බෞද්ධයින්ගේ හදවත් තුළ ජීවමානව පැවතිණි. හින්දු බලය තුළ මෙන්ම පෘතුගීසි ලන්දේසි පාලන වකවානුව තුළ සිංහල බෞද්ධ සමාජයට එල්ලවූ පීඩනය නිසා සංඝ ශාසනය දෙදරා ගියත් ඉතිහාසයේ කිසිම අවස්ථාවක බෞද්ධයෝ ජයශ්‍රීමහා බෝධිය අත් නොහළහ. ඉතිහාසයේ සෑම කල්හිම ජය ශ්‍රී මහාබෝධිය ආශ්‍රිතව සංඝයා වහන්සේ සඳහා විහාරයක් පැවතිණි. 19 වන සියවසේ මුල් භාගය වනවිට මුළු අනුරාධපුරයටම තිබුණේ ඒ විහාරාය පමණය. එහි හැම කල්හිම බෝමළුවේ නායක තෙරුන්වහන්සේ වැඩ සිටියහ. සසුන පිරිහී ගිය අවධියේ වුවද උපසම්පදා රහිත සාමනේර හිමිවරු බෝධිය රැක්කාහ. මිහිඳු හිමියන් ලංකාවට බුදු සසුන ගෙනාවා සේ ලක්දිව යළි සංඝ සමාජය පිහිටුවා සසුන චිරස්ථායී කරන්නේ වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමිපාණෝය. එතෙක් විතැන්ව ගිය ශාසනික සංස්ථාව විධිමත් කරවන උන්වහන්සේ අනුරාධපුරයේ ජය ශ්‍රී මහාබෝධිය මූලික කරගත් අටමස්ථානයේ භාරක ාරත්වයට උන්වහන්සේගේ සමකාලීන හිමිනමක් වූ ඉලූපැන්දෙණියේ අත්තදස්සී හිමියන් වෙත පැවරූහ.

සරණංකර හිමි ඇති කළ බෞද්ධ ප්‍රබෝධය දහනව වන සියවසේ මුල් කාර්තුව තුළ ඉංග්‍රීසීන්ට එරෙහිව සිංහලයන් ඇතිකළ තීරණාත්මක කැරලි දෙකකින් පසු-වත් යටපත් නොවිණි. මේ ගැටුම් සහිත වටපිටාව යම් ආකාරයක බෞද්ධ පුනරුදයක් ද ඇති කළේය. එක්දාස් අටසිය තිස් ගණන්වල සිට සත්කොරළයේ සංඝ-යාවහන්සේලා අනුරාධපුරයේ අත්හැර දමා තිබූ සිද්ධස්ථාන ආශ්‍රිතව පදිංචි වෙමින් මේ ශාසන ව්‍යාපාරය තීව්‍ර කළහ. ක්‍රිස්තුවර්ෂ 1828 හා 1829 අවුරුදුවල අති-ශය දිරිමත් හිමි නමක් අභයගිරියේ කටු කොහොල් හැරීමේ දුෂ්කර කාර්යයේ නිරතවූවාහු බරපතළ අනතුරකටද ලක්වූ අයුරු අයිවර්ස් සිය වාර්තාවේ ඇතුළත් කළේය.


වර්ෂ 1840 වනවිට එක් හිමිනමක් බැතිමතුන්ගේ ආධාර සහිතව ථූපාරාමය මුළුමනින්ම ප්‍රතිසංස්කරණය කර තිබිණි. මේ දාගැබ් කර්මාන්තයේ ඉදිකිරීම් කර තිබුණේ සින්න අදිකාර් නම් දෙමළ ජාතිකයෙකි. 1869 -1870 වසරවල අනුරාධපුරයේ නටබුන් තිබූ තත්ත්වය ගැන වාර්තාකරන උප ඒජන්තවරයෙක් වූ එල්.සී ලීසිං ථූපාරාම දාගැබ ඉතා මනරම්ව ඊට සුවිශේෂී ගල්කණු අතර පවතින ආකාරයත් එය බොහෝ දුරක් ඈතට දර්ශනය වන ආකාරයත් ලියා තැබුවේය. අභයගිරිය හා රුවන්වැලි සෑය අතර යටි කැලය කපා දැමීමත්, හරසරින් වන්දනාවට ලක්වෙමින් පැවැති ලංකාරාමය අවට ශුද්ධ පවිත්‍ර කිරීමත් ආණ්ඩුව විසින් කර තිබිණි.

sinhalaebooks.com



sinhalaebooks.com

## 2.4 නාරංවිට සුමනසාර හිමි


නාරංවිට සුමනසාර හිමි

ශ්‍රී මහා බෝධිය භාරව උඩරට රාජධානි සමයේ සිට ඉපලෝගම අත්ථදස්සි නමින් තෙරුන් වහන්සේ නමක් සිටිය ද 1869 වන තුරු රුවන්මැලි සෑ භූමියේ ආවාසයක් හෝ භික්ෂු වාසයක් නොවීය. උඩරට ඇතුළු දිවයිනේ සමහර පළාත්වලින් පොසොන් සමයේ පමණක් ශ්‍රී මහා බෝධිය වැඳීමට විශාල සැදැහැවතුන් පිරිසක් පැමිණි අතර එම පිරිස් නටබුන්ව වන වැදී තිබූ රුවන්මැලි සෑය වැඳීමට ද ගිය හෙයින් ශ්‍රී මහා බෝධි ආවාසයේ වැඩසිටි එක් භික්ෂුවක් පොසොන් සමයට පමණක් රුවන්මැලි සෑයට වැඩම කිරීමක් වාර්තා වී ඇත. ඒ පරිසරය යටතේ 1853 පොසොන් සමයේ දී සැදැහැවතුන් පිරිසක් විසින් පෙරහරක් පවත්වා ස්තූපය මුදුණේ කොතක් පැලඳ වූ බව උතුරු මැද පළාත් ඒජන්ත ඉංග්‍රීසි ජාතික අයිවර්ස් සඳහන් කර ඇති අතර එහි ඡායාරූප ද දක්නට ලැබේ.

එසේ නටබුන්ව තිබූ රුවන්මැලි සෑයේ භාරකාරත්වයට මෑත යුගයේ ප්‍රථමයෙන් ම පත් වන්නේ නාරංවිට සුමනසාර හිමිය. උන් වහන්සේ මරදන්කඩවල අසල කොස්සෝකන්ද ආරණ්‍ය වාසයේ සිට රුවන්මැලි සෑය භාරව පැමිණි ආකාරය ගැන විස්තර දක්නට ඇත. ඒ වන විට නුවරකලාගම් පළාත භාර ව සිටි රත්වත්තේ රටේ මහතා සහ හුරුළු පළාත හා උලගල්ලේ රටේ මහතා ගරා වැටෙමින් පැවැති රුවන්මැලි සෑය ගැන අවධානය යොමු කරමින් රුවන්මැලි සෑයේ ආගමික කටයුතු ක්‍රියාත්මක කළ හැකි හා එම ස්ථානය වැඩි දියුණු කළ හැකි සිල්වත් හා ජවය ඇති භික්ෂුවක් ලබාදෙන ලෙස කොස්සෝකන්ද වනවාසි භික්ෂු ප්‍රධානීන්ට කරන ලද ඉල්ලීම අනුව කොස්සෝකන්ද වනවාසයේ වැඩ සිටි තරුණ භික්ෂුවක වූ නාරංවිට සුමනසාර හිමි සුදුසු බව උන්වහන්සේලා විසින් යෝජනා කර ඇත.

ඒ අනුව එහි වැඩම කළ උන්වහන්සේ සැදැහවතුන්ගේ සහයෝගයෙන් රුවන්මැලි සෑයේ වැවී තිබූ ගස් කොළන් එළිපෙහෙළි කරමින් සිටි අවස්ථාවේ උන් වහන්සේ පිළිබඳ තොරතුරු විමසා බලා රුවන්මැලි සෑයේ සංවර්ධන කටයුතු කිරීමට නම් සියම් නිකායට හැරී ඒ බව සහතික කරන ලිපියක් මල්වතු මූලස්ථානයෙන් ගෙන එන ලෙස අටමස්ථානාධිපති හිමි දැනුම් දුන් බවත් ඒ අනුව උන්වහන්සේ සියම් නිකායට හැරී මල්වතු අධිකාරියෙන් ලිපියක් ගෙනා බවත් ප්‍රවාදයේ පවතී.

එසේ 1872 දී උන්වහන්සේ රුවන්වැලි චෛත්‍යාධිකාරි ලෙස පත් වීමෙන් පසු රුවන්මැලිසෑයේ ප්‍රතිසංස්කරණ කටයුතු ඇරඹුහ. වර්ෂ 1899 සිට වලිසිංහ හරිස්චන්ද්‍ර තුමාත් එම කටයුත්ත සඳහා සම්බන්ධ විය. වර්ෂ 1912 සිට රුවන්මැලි සෑ සංවර්ධනය සඳහා ආධාර ලබා ගැනීමටත් අනුරාධපුර බෞද්ධ ප්‍රබෝධය ඇති කිරීමටත් "සිරි අනුරාපුර පුවත" නමින් පුවත්පතක් මුද්‍රණය කර රට පුරා බෙදා හැරීමටත් කටයුතු කර ඇත. (එම පුවත්පත ජාතික ලේඛනාගාරයේ ඇත.) කොස්සෝකන්ද අරණ්‍යයේ වැඩසිටි නාරංවිට සුමනසාර හිමියන් උපසම්පදාව ලබාතිබුණේ රාමඤ්ඤ නිකායෙනි. වර්ෂ 1864 රාමඤ්ඤ නිකාය ආරම්භ වූ මුල් සමයේ දී ම නුවරකලාවිය ප්‍රදේශයේ එම නිකාය ව්‍යාප්ත වූයේය

sinhalaebooks.com



අවස්ථා කීපයකදීම රුවන්මැලි සෑයේ කටයුතු සුළු වශයෙන් සිදුව තිබුණු අතර 1835 දී වැඩම කළ භික්ෂූන් වහන්සේලා කීප නමකගේ මූලිකත්වයෙන් වල් බිහිව පැවති රුවන්මැලි සෑය හැකි පමණින් එළි පෙහෙළි කොට, සෑය සුදු රෙදිවලින් වසා ඉන් අනතුරුව මහා පිංකමක් සිදුකරනු ලැබුවේ කුඩා ප්‍රමාණයේ පිත්තල කොත් වහන්සේ නමක් සෑය මුදුනේ ස්ථාපනය කරමිනි.

sinhalaebooks.com

## 2.5 කඳුගැටයක් මත ඇඳුණු සිහිනය

වර්ෂ 1872 වන විටත් රුවන්මැලි මහාසෑය පුංචි මිනිසුන්ගේ ශ්‍රද්ධාවෙන් පමණක් පහන්වන උස් කන්දක් සහිත වන දූර්ගයකි. ඒ කඳුගැටය වසාගත් අභිමානවත් දාගැබක විත්තිය ශ්‍රද්ධා සම්පන්න බැතිමත් සිත්වල ඇඳී තිබිණි. ඒ සිහිනය බෞද්ධ ලෝකය වෙත සැබෑ කර දීම යථාර්ථවත් කිරීමේ ව්‍යාපාරය ආරම්භ කළේ එවකට විසිතුන් හැවිරිදි වියෙහි පසුවූ නාරංවිට සුමනසාර නම් හිමිනමකි. සුමනසාර හිමියන්ගේ අප්‍රකට තොරතුරු පිළිබඳ ලියැවුණු ලිපියක් රුවන්මැලි සෑයේ කොත් නිරාවරණ උත්සවය වෙනුවෙන් වර්ෂ 1840 ජූනි මස 18 දා දිනමිණ පුවත්පතේ පළවූයේය. ඒ ලිපිය අනුව නාරංවිට සුමනසාර හිමියන්ගේ මුල් ගම මහනුවර ප්‍රදේශයේය. උන්වහන්සේ පැවිදි වන්නේ රද්දොළුව සුබෝධාරාමයේය. මුලින්ම රද්දොළුවට එන්නේ ගැල්සාත්තුවක් පිටුපස පැමිණි නාඳුනන දරුවෙකු ලෙසය. ගැල් මගින් ගොස් කෝපි එකතු කර අලෙවි කිරීම වෘත්තිය කරගත් මීගමුව වැත්තෑව ප්‍රදේශයේ මනංචි රේන්දරාල නමැත්තා සමඟ මේ කුඩා දරුවා මීගමුවට පැමිණි පසු ඔහුව ඇති දැඩි කරගන්නේ රද්දොළුවේ ලංසියාවාඩියේ ජුසේ ආරච්චි නැමැත්තෙකි.

කුඩා දරුවා අකුරු කරන්නට යන්නේ රද්දොළුවේ පන්සලටය. හේතු සම්පත් සහිත අංග ලක්ෂණ වී යැයි කියන ඔහුව නාරංවිට සුමනසාර නමින් පැවිදි කරගන්නේ රද්දොළුව සුබෝධාරාමාධිපතිව සිටි සෝමානන්ද හිමිය. සෝමානන්ද හිමියෝ රාමඤ්ඤ මහා නිකායේ මිහිනමක් වූහ. නාරංවිට සුමනසාර හිමියෝ රාමඤ්ඤ නිකායික හිමිනමක් සේ පැවිදි දිවියට පිළිපන්හ. හිතුවක් කරනු රිසි හැඩි දැඩි සිරුරක් සහිත මේ හිමියෝ ගමේ ගැටවුන් සමඟ සංචාරයන්හි නිරතවන්නාහු වර්ෂ 1872 දී අනුරාධපුරයට පැමිණියහ. මේ මහා සෑය ගරාවැටී ඇති ආකාරය උන්වහන්සේ දුටුවහ. පැමිණි පිරිස සමගම ගරාවැටුණු සෑයේ කටුකොහොල් ඇරීම ඇරඹූ උන්වහන්සේගේ කටයුත්ත ලත් තැනම ලොප් වෙන්නට වැඩ යෙදිණි. එවකට අටස්ථානාධිපතිව වැඩ වාසය කළ කළුඑබේ ශ්‍රී සුමන ධම්මරක්ඛිත හිමියන්ට සිද්ධිය වාර්තා වී තිබුණේ පිරිසක් රුවන්මැලිසෑයේ නිදන් හාරන බවටය. උන්වහන්සේ සුමනසාර හිමි ප්‍රමුඛ පිරිස තමන් ඉදිරියට පැමිණවූහ.  හෙළිවන පරිදි තරුණ හාමුදුරුවන්ගේ උත්සාහය රුවන්වැලිසෑය පිළිසකර කිරීමය. එහෙත් මේ තරුණ හාමුදුරුවන් රාමඤ්ඤ නිකායේය. දැන් ගැටලුවකි. රුවන්වැලි දාගැබ වනදහන ගිල ගත් පස් කන්දක් වී තිබූ බව සැබෑය. අභයගිරිය හා ජේතවනය දාගැබ් වරදවා හඳුනා ගන්නා තරමට අමතකව ගොස් තිබූ බව සැබෑය. ඒ සිද්ධස්ථානවල මිනිස් පුළුටක් නොවුණ බවත් සැබෑය. එහෙත් රුවන්මැලි සෑය ඇතුළු අටමස්ථානය අයත් වී තිබුණේ සියම් නිකායටය. මල්වත්ත මහ පන්සලටය. අටමස්ථානාධිපතිව වැඩ සිටියේ කළුඑබේ ශ්‍රී සුමන ධම්මරක්ඛිත හිමියන් සුමනසාර හිමියන්ට කොන්දේසියක් ඉදිරිපත් කළහ. ඒ කොන්දේසිය මෙසේය. දාගැබත් අවට භූමියත් අයත් සියම් නිකායටය. එය වෙනත් නිකායක හිමි නමකට පැවරිය නොහැකිය. අස්ගිරිය මහ පන්සලට ගොස් සියම් නිකායේ පැවිදි වී උපසම්පදාව රැගෙන පැමිණියහොත් පමණක් රුවන්වැලි සෑයේ ප්‍රතිසංස්කරණය නාරංවිට හාමුදුරුවන්ට භාර දිය හැකිය. නාරංවිට සුමනසාර හිමියෝ එම කොන්දේසිය පිළිගත්හ.

අනතුරුව උන්වහන්සේ උපවැදි වූහ. රුවන්මැලි මහා සෑය වෙනුවෙන් රාමඤ්ඤ මහා නිකාය අත්හලහ. වැඩ කටයුතු පසෙක තබා ගිහියකු සේ මල්වත්ත පන්සලට ගියහ. ගොස් එහි පැවිදිව උපසම්පදාව ලබාගත්හ. පැවිද්ද හා උපසම්පදාව ලද බවට වූ ලේඛනයක් සහිතව යළිත් අටමස්ථානාධිපති හිමියන් හමුවූහ. දැන් නාරංවිට සුමනසාර හිමියන් සියම් නිකායේ හිමි නමකි. රුවන්මැලි සෑය පිළිසකර කිරීමේ අවසරය හා ස්ථානයේ භාරකාරත්වය උන්වහන්සේට ලැබෙන්නේ ඉන් අනතුරුවය. සියම් නිකායේ ආශීර්වාද සහිතව 1873 දී සුමනසාර හිමියෝ රුවන්මැලි සෑ ප්‍රතිසංස්කරණ කර්මාන්තය ආරම්භ කළහ. අතේ ශත පහක මුදලක් නැතිව උත්සාහය හා යහපත් ප්‍රාර්ථනාවන් පමණක් සහිතව කටයුතු ඇරඹූහ. මහා ජන ප්‍රසාදයක් එතුමන් වටා ගොඩනැගිනි. ආධාර ගලා ආවේය. මේ සමගම රුවන්මැලි සෑයටත් වඩා මහා අභියෝග නාරංවිට හාමුදුරුවන් ඉදිරියට පැමිණියේය. අනගාරික ධර්මපාල තුමා මේ ජාතික ව්‍යාපාරයට එරෙහිව ජනමතයක් ගොඩනැගීම ආරම්භ කළේය. සුමනසාර හිමියන් හා එක්ව සිටි ධර්මපාල තුමාගේ යහපත්ම ගෝලයා වන වලිසිංහ හරිශ්චන්ද්‍ර තුමා උන්වහන්සේ අත්හළහ. අප නුදුටු, අප නොදකින මමංකාරය සහිත අශ්ලීල දේශපාලනයේ විවිධ විකෘති ඒ වකවානුවේදීත් සෑම සමාජ ව්‍යාපාරයක් තුළමත් ගැබ් වී තිබිණි.

sinhalaebooks.com



sinhalaebooks.com

## 2.6 රුවන්මැලි සෑ ප්‍රතිසංස්කරණය

නාරංවිට සුමනසාර හිමි විසින් රුවන්මැලි සෑය ගරා වැටීමෙන් සලපතළ මළුවේ රැස් වී තිබූ සුන්බුන් හා පස් ඉවත් කිරීම 1872 අප්‍රේල් සිට ආරම්භ කරන ලද බව එවකට අනුරාධපුර ආණ්ඩුවේ ඒජන්ත ඩික්සන්ගේ වාර්තා, සහ සිරි අනුරාපුර පුවත නම් පුවත්පත (සිරි අනුරාපුර පුවත. 1909. දෙසැ:01) ආදී මූලාශ්‍රයවල සඳහන් ය. රජරට ශිෂ්ටාචාරය 1215 න් පසු වන වැදී යෑම නිසා එතැන් පටන් ගරා වැටෙමින් තිබූ රුවන්මැලි සෑයේ 1829 දී විශාල නාය යෑමක් ද 1885 දී විශාල නාය යෑම් දෙකක් ද සිදු වූ බව ඒජන්ත ඩික්සන් සඳහන් කර ඇත. එම ගරාවැටීම් ද ඉවත් කළ සුන්බුන් අතර විය.

1872 සිට නාරංවිට සුමනසාර හිමි රුවන්මැලි සෑයේ සංවර්ධන කටයුතු ආරම්භ කරමින් සිටි අවස්ථාවක ග්‍රෙගරි ආණ්ඩුකාරයා එහි පැමිණ විට වූ සිද්ධියක් සිරි අනුරාපුර පුවත ප්‍රවෘත්ති පත්‍රයේ සඳහන් ය. බරකරත්තයකට පොල් අතු කිහිපයක් වසා සාදාගත් ආවරණයක් යට උන්වහන්සේ වැඩසිටි බවත් සතෙකු යැයි සිතා ආණ්ඩුකාරයා විසින් උන්වහන්සේට වෙඩි තැබීමට සූදානම් වූ අවස්ථාවේ උන්වහන්සේගේ කැගැසීම නිසා වෙඩි තැබීම වැළකී ඇති බවත් සඳහන්ය.

අනතුරු ව උන්වහන්සේ එහි කුමක් කරන්නේදැයි ආණ්ඩුකාරයා විසින් කළ විමසීමට පිළිතුරු වශයෙන් ස්තූපය සංරක්ෂණයට සූදානම් වන බව පවසා ඇත.

ආණ්ඩුකාරයාගේ පිළිතුරු වූයේ “උඹලාගේ ආගමේ නැවත උපදින බව කියා තිබෙනවා නොවේද? උඹ හත් පාරක් ඉපදුණත් එය කාර්යය කළ හැකිද?” යන්න ය. ඉන් වසර කිහිපයකට පසු නැවත එහි පැමිණ එම ආණ්ඩුකාරයා ස්තූපයේ සුන්බුන් පස් ඉවත් කිරීමේ ප්‍රගතිය දැක ‘උඹ නම් නියම සිංහලයෙක්‘ යැයි පවසා ආධාර මුදලකුත් එම කාර්ය කරගෙන යෑම සඳහා සහතික පත්‍රයකුත් ලබා දී ඇත. (සිරි අනුරාපුර පුවත 1918.01.01)

sinhalaebooks.com






නාරංවිට සුමනසාර හිමි


ගම්පොළ ප්‍රදේශයේ සිට
අනුරාධපුරයට වන්දනාවේ
පැමිණි, නාරංවිට
සුමනසාර හිමි මේ පුණ්‍ය
කටයුත්තට මුල් වූහ.
කිසිදු පහසුකමක්
නොතිබුණු කාලයක 23
වියැති සුමනසාර
හිමිපාණෝ කළ
අධිෂ්ඨානයෙන් ඉතා
මනරම්ව යලිත්
ගොඩනැගූ මහා ථූපය
වන්දනා කිරීමේ අවස්ථාව
ලෝකවාසී බෞද්ධ
ජනතාවට උදාවී තිබේ

sinhalaebooks.com

# THE RUWANWELI DÁGABA.

PLATE XXIV

West Elevation.



sinhalaebooks.com

## 2.7 ප්‍රතිසංස්කරණය කළ බැම්ම බිඳ වැටීම

උන්වහන්සේ දඹදිව ගොස් සිටි අවස්ථාවක එතෙක් ඉදි කර තිබූ ප්‍රතිසංස්කරණ කොටස් ගැලවී බිමට පතිත වී තිබේ. ඒ පිළිබඳ අදහස් කීපයක් වුව ද අතර එතෙක් කළ කොටස පෙර ස්තූපයෙන් ගරාවැටී තිබූ ගඩොල් කැබලිවලින් බැඳීම නිසා බන්ධනය නිසි ලෙස සිදු නොවීමෙන් වූවක් සේ ද සලකා ඉන් පසු සම්පූර්ණ ගඩොල් පමණක් භාවිතයට ගෙන ඇත. ගරා වැටුණ රුවන්මැලි සෑ පිට ප්‍රාකාරය මතට සුන්බුන් පස් පිරෙන්නට ඇත්තේ එම අවස්ථාවේ දී ය.



1872 වන තුරු ස්තූපය කඩා වැටීමෙන් රැස්වූ සුන්බුන් හා 1910 නොවැම්බර් 07 දින එතෙක් ප්‍රතිසංස්කරණය කර තිබූ කොටස කඩා වැටීමෙන් (සිරි අනුරාපුර පුවත.1911. ජනවාරි 01) එම සුන්බුන් රැස්වී ඇත. 1872 සිට ස්තූපය ගරා වැටීමෙන් ස්තූපයේ පහළ කොටසේත් සලපතළ මළුවේත් රැස්ව තිබූ පස් හා සුන්බුන් ඉවත් කිරීම සුළුපටු කාර්යක් නොවේ. ඒ ආකාරයෙන්ම අභයගිරි ස්තූපයේ ගරා වැටීමෙන් රැස්ව තිබූ පස් හා සුන්බුන් රාජ්‍ය මැදිහත් වීමෙන් ඉවත් කිරීමට වැය වූ ශ්‍රමය හා මුදල් ප්‍රමාණය දෙස බලා සංසන්දනය කිරීමේ දි යන්ත්‍ර සූත්‍ර නැතිව උන් වහන්සේ කර ඇති කාර්ය සුළුපටු නොවේ.

sinhalaebooks.com



# බ්‍රහ්මචාරී වලිසිංහ හරිචන්ද්‍ර

රුවන්මැලි චෛත්‍යවර්ධන සමිතිය පිහිටුවා ගැනුණේ 1902 දී ය. අනුරාධපුර පූජා නගරය ඉංගීරසීන්ගේ ග්‍රහණයෙන් මුදාගැනීමේ උදෙසා අභීතව සටන් වැදුණු බ්‍රහ්මචාරී වලිසිංහ හරිචන්ද්‍රතුමා චෛත්‍යවර්ධන සමිතියේ ආරම්භක සභාපතිවරයා විය. කෙටි කලකින්ම චෛත්‍යවර්ධන සමිතියේ ශාඛා සමිති ලංකාව පුරාම බිහිවුණා.

සුමනසාර හිමියන්ගේ උපදේශකත්වයෙන් 'සිරි අනුරපුර පුවත' නමින් පුවත්පතක් ද ආරම්භ කෙරුණේ රුවන්මැලිසෑයේ ප්‍රතිසංස්කරණ කටයුතු සහ චෛත්‍යවර්ධන සමිතියේ කාර්යභාරය මෙන්ම එහි අයවැය පිළිබඳ බෞද්ධයන් දැනුවත් කිරීමේ අරමුණ ඇතිව ය.

සිරි අනුරපුර පුවතේ සමාරම්භක කතුවරයා වශයෙන් කටයුතු කරනු ලැබුවේ ද වලිසිංහ හරිශ්චන්ද්‍රතුමන් ය.

sinhalaebooks.com

ඒ අනුව එතුමා සමඟ එක්ව නාරංවිට හිමි රුවන්මැලි සෑ චෛත්‍ය සංවර්ධන සමිතිය පිහිටුවා මහජන ආධාර ලබාගැනීමට සිරි අනුරාපුර පුවත නමින් පුවත් පතක් ද ආරම්භ කර තිබේ. එම සමිතියේ අනුශාසක වූයේ සුමනසාර හිමිය. සමිතිය මඟින් චෛත්‍ය සංවර්ධනය සඳහා ආධාර මුදල් එක්රැස් කරගැනීම හා එහි ප්‍රචාරක කටයුතු කරගෙන යෑමේ දී සිරි අනුරාපුර පුවත පත්‍රය විශාල කාර්යක් ඉටු කර ඇත.

දිවයින් පුරා සියලු ගම් නියම්ගම් නගර ආවරණය වන පරිදි කරන ලද ප්‍රචාරය නිසා රුවන්මැලි චෛත්‍ය සංවර්ධන සමිතියේ ශාඛා විශාල සංඛ්‍යාවක් දිවයිනේ බොහෝ ප්‍රදේශවල ආරම්භ වී ඒ මඟින් ආධාර මුදල් එක්රැස් කර තිබේ. ඒ ඒ අවස්ථාවේ සැදැහැවතුන් ලබාදුන් මුදල් ප්‍රමාණය එම පුවත් පත මඟින් ප්‍රකාශයට පත් කිරීම නිසා ජනතාව අතර තම පරිත්‍යාග පිළිබඳ විශ්වාසයක් ඇති විය.

ආධාර මුදල් රැස් කරගැනීමේ දී උන්වහන්සේ විසින් අනුගමනය කළ තවත් ක්‍රමයක් පුවත් පතේ සඳහන් ය. එනම් ගමින් ගම පිං පෙට්ටියක් තබා ආධාර රැස් කිරීමය. තව ද පතල් කර්මාන්ත කරුවන්ට හා තේ පොල් කුරුඳු හා පැඟිරි කර්මාන්තකරුවන්ට ආරාධනා කරමින් ඔවුන්ගේ ආයතනවල සේවය කරන පිරිස්වලින් වැටුප් ගෙවීමේදී වැටුපෙන් ස්වල්පයක් පුණ්‍ය කටයුතු සඳහා ලබාගෙන එය රුවන්මැලි සෑයේ සංවර්ධනය සඳහා එවන ලෙස ය.

පුවත්පත මඟින් සිදුවූ තවත් සද් කාර්යයක් වූයේ රුවන්මැලි සෑය ගැනත් ලංකාවේ බෞද්ධ ඉතිහාසය පිළිබඳත් පොදු ජනතාව දැනුවත් කෙරනෙ ලිපි පෙළක් ප්‍රචාරය කරවීම ය. සෑයේ ප්‍රතිසංරක්ෂණ කටුයුතු අවසන් කිරීමට අවශ්‍ය ගඩොළු සංඛ්‍යාව හා ඒ සඳහා වැය වන මුදල වැලිගම උළුවඩුගේ තියදෝරිස් සිල්වා බාස් තැනගෙන් ලබාගෙන ගඩොල් 100ක් බැඳීමට රුපියල් පහක් ආදී වශයෙන් දැන්වීම් පළ කිරීමෙන් සමහර දායකයන් රුපියල් ලක්ෂය දෙක දෙන තත්ත්වයට වර්ධනය කරගැනීමට හැකි විය. උදාහරණයක් වශයෙන් අකුරැස්සේ හේනේගම සිටුගෙයි දොන් අන්ද්‍රියෙස් සිල්වා අප්පුහාමි රුපියල් ලක්ෂ දෙක හමාරක මුදලක් ලබාදීම සිරි අනුරාපුර පුවත පත්‍රයේ සඳහන් ය.

රුවන්මැලි සෑය සංවර්ධනය සඳහා උන් වහන්සේ විසින් දිවයින පුරා ගෙන ගිය ප්‍රචාරක කටයුතුවල අතුරු ප්‍රතිපලයක් ද විය. එනම් ලංකාව පුරා සිටි බෞද්ධ ජනතාවගේ අවධානය අනුරාධපුර බෞද්ධ නටබුන් කෙරේ යොමු වීම ය. එමඟින් බෞද්ධ ජනතාව අනුරාධපුරය දැකබලා ගැනීමටත් එහි පුරාණ සිද්ධස්ථාන වැඳ පුදාගැනීමටත් වැඩි වැඩියෙන් පැමිණීම අනුරාධපුර බෞද්ධ බලවේගය වැඩි දියුණු වීමටත් ශුද්ධ නගරය ආරක්ෂා කරගැනීමටත් හේතු විය

sinhalaebooks.com

## 2.8 ඇවරියවත්තේ වෙදමහත්තයා

කටුනායක ඇවරිවත්තේ පදිංචිව සිටි කුමාරසිංහ රන්සිරිනෙල් පෙරේරා නමැති ප්‍රභූ සිංහල වෛද්‍යවරයෙක් සුමනසාර හිමියන් බැහැදැකීමට පැමිණෙන්නේ මේ අතරය. දාගැබ් බැම්ම බිඳවැටීමෙන් සිදුවූ ව්‍යසනයෙන් හේ කම්පා වී සිටියේය. කටුනායක ඇවරිවත්තේ ශ්‍රී සුමිත්‍රාරාම විහාරාධිපති මිනුවන්ගොඩ රතනජෝති සහ ඇවරියවත්තෙ ජිනරතන යන නා හිමිවරුන්ගේද උපදෙස් සහිතව අනුරාධපුරයට එන ඔහු සුමනසාර හිමියන් හා කථිකා කරගෙන 1910 වසරේ අග භාගයේදීම යළි ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කළේය. එම වසරේම අග භාගයේ යළිත් වැඩ කටයුතු ඇරඹිණි.

වර්ෂ 1912 දී රුවන්වැලි සෑ චෛත්‍යවර්ධන සමාගමේ සභාපතිත්වය කුමාරසිංහ රන්සිරිනෙල් පෙරේරා වෙදරාළහාමි භාර ගත්තේය. රන්සිරිනෙල් වෙදරාළහාමි වැඩ ආරම්භ කරනු ලැබුවේ ඉහළ දැනුමක් සහිත ඉංජිනේරු උපදෙස් ලබාගනිමිනි. ඒ වකවානුව වනවිට ඒ සඳහා අවශ්‍ය සමාජ පරිසරය නිර්මාණය වී තිබිණි. එම උපදෙස් ප්‍රකාරව සුමනසාර හිමියන් වසර හතලිහක් තිස්සේ බැන්දවූ ගඩොල් බැම්ම මුළුමනින් ඉවත් කිරීමට සිදුවූයේය. යළි අලුතින්ම ඉදිකිරීම් ආරම්භ විය. රන්සිරිනෙල් වෙද රාළහාමි රුවන්වැලි චෛත්‍යවර්ධන සමාගමට අලුත් පරමාර්ථයක් එක් කළේය. ඔහු ඒ වකවානුවේ දී ස්වකීය ධනයෙන් රුපියල් ලක්ෂයක් පමණ දාගැබ් කර්මාන්තය වෙනුවෙන් වැය කරනු ලැබුවේය.මේ කාලයේ දී අනුරාධපුරය දක්වා දුම්රිය ගමනාගමනය ඇරඹී තිබිණි. දහස් ගණන් සැදැහැතියෝ අතීත නගරය වන්දනා කරන්නට මුල් වරට නිදහසේ අනුරාධපුරයට පැමිණෙමින් සිටියහ. මේ උද්‍යෝගීමත් ප්‍රභූවරයා වසරක් පාසා මුලු දුම්රියක්ම වෙන් කර ගත්තේය. එම දුම්රියෙන් ඇවරියවත්ත, අමන්දොළුව, රද්දොළුව, උදම්මිට වැනි ගම්වල තරුණයන් පුරවාගෙන අනුරාධපුයට පැමිණියේය. දින ගණන් ශ්‍රමදාන පිංකම් සංවිධානය කර මහා සෑයේ වැඩ කටයුතු කළේය. මේ අතර අසිරිමත් සිදුවීමක් සිදුවිය.

වර්ෂ 1912 දී රුවන්වැලි සෑ වන්දනාව සඳහා අකුරැස්ස ප්‍රදේශයේ සිට සිටුගේ දොන් හේන්ද්‍රික් සිල්වා හෙවත් හේනේගම අප්පුහාමි නමැති සිංහල ප්‍රභූ වරයෙක් පැමිණියේය. හේ වැවිලි කර්මාන්තයෙන් ධනවතෙක් වූ ශූර ව්‍යාපාරිකයෙකි. සරල ගැමි පෙනුමකින් යුතු මේ දානපති ව්‍යාපාරිකයා රුවන්වැලිසෑ ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් ලක්ෂ දෙකහමාරක් පරිත්‍යාග කළේය. එය ඇදහිය නොහැකි තරම් දැවැන්ත ප්‍රදානයක් විනි. මේ මුදල එවකට රුවන්වැලි සෑ චෛත්‍ය කර්මාන්තය සඳහා ඇස්තමේන්තුගත මුදලින් පහෙන් එකකට ආසන්න විය.



sinhalaebooks.com

## 2.9 ලක්ෂ දෙකහමාරක් පිරිනැමූ ගැමි සිටු වරයා

එය 1912 වසරේ ජුනි මස 03 වැනිදාය. තවත් ආකාරයකින් කියනවා නම් එම වසරේ පොසොන් පුර පසළොස්වක පෝ දිනයයි. දහස් සංඛ්‍යාත සැදැහැවත් බොදු බැතිමතුන් පිරිසක් සුදෝ සුදු වතින් සැරසී සුදුවන් වැලි තලයෙන් යුතු රුවන්වැලි සෑ මළුවේ බණ භාවනාදී පිංකම්හි නිරතවී සිටිති. සුදු වතින් සැරසීගත් බාලිකාවෝ පිරිසක් එම සැදැහැවතුන් වෙත පැමිණ ආධාර එකතු කරමින් සිටිති. ඒ රුවන්වැලි සෑ රදුන්ගේ පරතිසංස්කරණ කටයුතු සඳහාය.




පරසන්න පෙනුමකින් යුතු උත්තුංග දේහධාරී වයෝවෘද්ධ සැදැහැවතෙක් කුඩා පිත්තල වංගෙඩියක් තුළ බුලත් විටක් කොටමින් සිටියේය. ආධාර එකතු කරමින් පැමිණි බාලිකාවෝ ඔහු වෙත පැමිණියහ. "සීයා.... චෛත්‍යයේ පරතිසංස්කරණ කටයුතුවලට ආධාරයක් දෙන්න." බාලිකාවන් අතර සිටි කටකාර එකියක් කීවාය. "සීයා?... මම කොහොමද බොලාට සීයා වෙන්නෙ?" වයෝවෘද්ධ සැදැහැවතා සිනාමුසු මුහුණින් යුතුව මෘදු ස්වරයෙන් ඇසීය. ඔහුගේ පරශ්නයට පිළිතුරක් සොයාගත නොහී දැරියෝ පසුබා නිහඬව බලා සිටියහ.  ඒ දරුවො ඔහේට සීයා කියල කථා කළේ වැඩි ආදරේට නේ අප්පුහාමි. සැදැහැවතා අසලින් වාඩිවී සිටි එම වියේම පසුවන අනෙක් සැදැහැවතා බාලිකාවන් වෙනුවෙන් කථා කළේය. එහෙමද? එහෙනම් ලියාගනිල්ලා මගෙන් රුපියල් ලක්‍ෂ දෙකහමාරක්. සැදැහැවතා ගත් කටටම කීවෙන් බාලිකාවෝ ඔහුට උපහාසාත්මක ලෙසින් සිනාසෙමින් එතැනින් නික්ම ගියහ.ඇත්තටමද අප්පුහාමි ඔහේ ඒ දරුවන්ට ලක්‍ෂ දෙකහමාරක් ලියා ගන්න කිව්වේ? මිතුරා සැදැහැවතා අමතා ඇසීය. අද මේ පොසොන් පුර පසළොස්වක පෝය දවසෙ අටසිල් සමාදම් වෙලා මේ උතුම් රුවන්වැලි සෑ මළුව ඉඳගෙන බොරු කියනවද මම? ඇත්තටම රූළහාමි ඔහේගෙ ඔළුවෙ අමාරුවක් තියෙනවාද? සැහැදැවතා සිනාසෙමින් තම මිතුරා ගෙන් ඇසීය. ඒ දරුවෝ නම් ඔහේගෙ කථාව තඹේකට විශ්වාස කළේ නෑ. ඒ නිසා ඔහේ ගැන ඉස්පිල්ලක් පාපිල්ලක් නෑරම දන්න මමවත් ඒ වචන විශ්වාස කළේ නෑ අප්පුහාමි. මිතුරා යළිත් කීවේය. රුවන්වැලි සෑ මළුව ඇතුළු මුළු පරදේශය පුරා සවිකර තිබූ ශබ්ද විකාශන යන්තර ඔස්සේ ඒ මොහොතේ නිවේදනයක් නිකුත් විය.

තිලෝගුරු සම්මා සම්බුදු පියාණන් වහන්සේගේ ශ්‍රී සර්වඥධාතු නිදන් කර ලංකාවාසී සැදැහැවත් ඔබ සැමට නිවන් පුර රුවන් දොර විවර කැරදීම සඳහා එදා අපේ ශ්‍රේෂ්ඨ නරපති දුටුගැමුණු මහ රජාණන් විසින් ඉදි කරන ලද්දාවූ රුවන්වැලි චෛත්‍ය රාජයාණන් වහන්සේ මේ වන විට තරමක් අබලන් තත්ත්වයකට පත්ව ඇති බැවින් වහා කළ යුතු පරතිසංස්කරණ කටයුතු සඳහා පුණ්‍යකාමී සැදැහැවත් ඔබ සැමගෙන් ශක්ති පරමාණයෙන් ආධාර අපේක්‍ෂා කෙරේ. සංසාර ගමන් මග කෙටි කැර ගෙන නිවන් දැකීමේ

sinhalaebooks.com

අරමුණ පෙරදැරි කැරගෙන මේ උතුම් පොසොන් පුර පසළොස්වක පෝදා මේ රුවන්වැලි සෑ පින්බිමේ අටසිල් සමාදම් වී සිටින සැදැහැවත් ඔබ සැම දහඩිය මහන්සියෙන් උපයාගත් මුදලින් මේ උත්තම පුණ්‍යකර්මය සඳහා තම තමන්ගේ ශක්ති පරමාණයෙන් දායක වන ලෙස අපි ඔබ සැමට කාරුණිකව ආයාචනා කරමු.

ශ්‍රද්ධා සම්පන්න ඔබේ නොමසුරු ආධාර භාර ගැනීම සඳහා මේ පුණ්‍ය භූමියේ පිහිටුවා ඇති කාර්යාලයේ නිලධාරී මහත්වරු සූදානම්ව සිටින බැවින් මේ උදාරවූ පුණ්‍ය කර්මයට දායකවී සුවදායිවූ මරණයක් කෙළවර අජරාමර නිවන් සුව පරාර්ථනා කැර ගන්නා ලෙස සැහැදැහැවත් ඔබ හැමට අපි ගෞරවපූර්වකව ආයාචනා කරමු. මේ එම නිවේදනයයි.

"අප්පුහාමි ඔහේට ඇහුනැයි? අපි යමුද ඔහේගෙ අර ලක්ෂ දෙකහමාර දෙන්න? මට නම් ලක්ෂ ගණන් නැති වග ඔහේ දන්නවනේ? මම බොහොම අර පිරිමැස්මෙන් ඉතිරි කර ගනිපු රුපියල් පන්සීයක් තියෙනවා. මගේ මිය පරලොව ගිය මාපියන්ට පින් සිද්ධ වෙන්න කියල මම ඒක පූජා කරනවා. මිතුරා එකී සැදැහැවතාට කීවේය. කොටමින් සිටි බුලත් විට අතට හලා එය දත් නැති මුව තුළ රුවාගත් හෙතෙම තම කුඩා පිත්තල වංගෙඩිය ශුද්ධ පවිතර කැර ගමන් මල්ල තුළට දමාගෙන නැගී සිටියේය. "යමු රාළහාමි යමු" හේ පෙරමුණ ගනිමින් මිතුරා ඇමතීය. දෙමිතුරෝ රුවන්වැලි සෑ කාර්යාලය භූමිය වෙත පැමිණෙද්දී එහි දිගු පෝලිමකි. එහි සිටි හැමෝම රුවන්වැලි සෑ රදුන්ගේ පරතිසංස්කරණ කටයුතු සඳහා මහත් ශ්‍රද්ධාවෙන් භක්තියෙන් දායක වෙනු පිණිස පැමිණියෝ වූහ. ඒ දෙමිතුරෝද පෝලිමේ අගට එකතු වූහ. රුපියල් දාහට වැඩි විශේෂ ආධාර දීමට බලාපොරොත්තු වෙන පින්වතුන් පෝලිමේ සිටීනම් කරුණාකර පෝලිමෙන් ඉවත්වී කාර්යාලය තුළට පැමිණෙන්න. සංවිධායකවරු ශබ්ද විකාශන යන්තරය හරහා තවත් නිවේදනයක් නිකුත් කළහ.

පෝලිමේ සිටි ගරු ගාම්භීර මහේශාඛ්‍ය පෙනුමෙන් යුතු පරහුවරු රැුසක් පෝලිමෙන් වෙන්වී කාර්යාලය තුළට ගියහ. "අන්න අප්පුහාමි... ඇහුණ නේද ඔහේට? ඔහේත් යන්න කාර්යාලය ඇතුළට. මිතුරා කීවේය.

අප්පුහාමි කාර්යාලය තුළට ඇතුළු විය. සල්ලිකාර පරහුවරුන් විස්සක් තිහක් පමණ එම කුඩා කාර්යාලය තුළ තෙරපෙති. දුප්පත් ගැමියකුගේ පෙනුම පරදර්ශනය කළ අප්පුහාමි ඒ හැමට විහිළුවක් උපහාසයක් වූ සෙයකි. ඔවුන් අප්පුහාමි නොරුස්නා සෙයක්ද මොනවට පරදර්ශනය විය. අප්පුහාමි ඔවුන් දෙපසට කරමින් ඉදිරියට ගියේය. "ඔන්න මහත්තයා ලියාගන්න මගෙන්....." අප්පුහාමිට සිය වාක්‍යය නිම කරන්නට ඉඩ නොදෙමින් එහි සිටි පරහුවරයෙක් කථා කළේය.

"ශත දහයක්" ඔහුගේ බහට එහි සිටි පරහුවරු සැවොම උපහාසාත්මක ස්වරයෙන් උස් හඬින් සිනාසෙන්නට වූහ."නෑ ශත විසි පහක්" අප්පුහාමි ඊටත් වඩා උස් හඬින් කීවෙන් පරහුවරු යළිත් සිනාසෙන්නට වූහ. "ඔය මහත්තයා යන්න අර පෝලිමට. මෙතැන ලියන්නෙ රුපියල් දාහට වැඩි විශේෂ ආධාර" සංවිධායකයෙක් කීවේය. "මහත්තයෝ ලියාගන්නකො විසි පහ ලියල දාන්න ඒකට අගට තව බිංදු හතරක් අප්පුහාමි උස් හඬින් කියා ආඩම්බර ලීලාවෙන් වට විට බැලූවේය."මොනවා? ශත දෙලක්ෂ පනස්දාහක්? අපබරංශයක්නෙ?" සංවිධායකයා විමතියෙන් ඇසීය."පිස්සෙක්... ඔල්මාද කාරයෙක්.... අංගොඩ ඉඳලා ගෙදර යන ගමන්" පරහුවරු මුමුනන්නට වූහ.

## "ශත දෙලක්ෂ පණස් දහක් නොවෙයි. රුපියල් 250,000!"

අප්පුහාමි යළිත් උස් හඬින් කීවේය. නිලධාරියා අප්පුහාමි දෙස පරීක්ෂාවෙන් බැලීය. පාදාන්තයේ සිට කේෂාන්තය දක්වාත් කේෂාන්තයේ සිට පාදාන්තය දක්වාත් අනුලෝම පරතිලෝම වශයෙන් බැලීය. "නම කොහොමද උපාසක මහත්තයෝ? නිලධාරියා ඇසීය. දොන් හෙන්ද්‍රික් සිටුගේ..... ගම අකුරැුස්ස හේනෙගම අප්පුහාමි පෙරටත් වඩා උස් හඬින් කීවේය. නිලධාරියා එම විස්තර ලියා ගත්තේය. තම ගමන් මල්ලෙන් චෙක් පොතක් හා පෑනක් එළියට ගත් අප්පුහාමි වටපිට බැලූවේය. "ආ..... මේ පුටුවෙ වාඩිවෙලා ලියන්න" නිලධාරියා සිය අසුනින් නැගී සිටිමින් කීවේය. "අද අපට උච්ඡාසයන අකැපයි නේ මහත්තයෝ. අද අපි අටසිල් සමාදම් වෙලා නොව. චැක් කඩදාසිය ලියලයි තියෙන්නෙ. අත්සන් කරන්න විතරයි ඇත්තෙ. "කී හෙතෙම තම චෙක් පොත නිලධාරියාගේ මේසය මත තබා අදාළ චෙක් පතෙහි අත්සන් කළේය.සැදැහැවතා දෙස උපහාසයෙන් බැලූ, ඔහුට සිනාසුණු යම් යම් උපහාසාත්මක වදන් කියූ එහි සිටි පරහුවරු ඔවුනොවුන්ගේ උරහිස් වලට ඉහළින් එබෙමින් චෙක්පත දෙස බලන්නට වූහ. ඒ ඔහු සැබැවින්ම එහි සඳහන් කැර ඇත්තේ රුපියල් දෙලක්ෂ පනස් දහසක්දැයි සැක හැර දැන ගැනීමටය. එහි සැබැවින්ම රුපියල් දෙලක්ෂ පනස් දහසක් ලියා තිබිණි. බොරු කාරයෙක්... වංචා කාරයෙක්.... කපටියෙක්.... පිස්සෙක්..... කාගෙ හරි චෙක් පොතක් අහුලලා වෙන්නැති. පරහුවරු ඔවුනොවුන්ගේ සවන් වලට මුහුණන්නට වූහ. සිය චෙක්පත අත්සන් කළ හෙතෙම එය පරෙස්සමෙන් පොතෙන් වෙන් කැර දෑතින්ම ගෙන නිලධාරියාට පිළිගැන්වීය."පින් සිද්ධ වෙච්චාවෙ උපාසක මහත්තයෝ." නිලධාරියා අසුනින් නැගිට දෑතින්ම එය පිළිගනිමින් කීවේය.

sinhalaebooks.com

"පින් තමයි මහත්තයෝ ඕනෑ. සල්ලි නම් කොච්චර තිබුණත් කිසි පලක් නෑ. යන කොට එක ශතයක් අරගෙන යන්න පුළුවන්ද? පින් නම් කොච්චර තිබුණත් කාරි නෑ. තියෙන තරමක් අරගෙන යන්න පුළුවනි." සිනාසෙමින් කී හෙතෙම එළියට බැස රුවන්වැලි සෑය දෙසට හැරී දොහොත් මුදුන් තබා මහ හඬින් "සාධු සාධු සාධු" කියා වැන්දේය. ඔහුට උපහාසාත්මක ලෙසින් සිනාසුණු යම් යම් උපහාසාත්මක වදන් කියූ පරහුවරු නිහඬව බිම බලාගත්හ. ඔවුන් එවේලේ පරිත්‍යාග කළේ දහස දෙදහස දෙදහස් පන්සීය යනාදී වශයෙනි. එකම පරහුවරයෙක් පමණක් රුපියල් පන් දහසක් පරිත්‍යාග කැර තිබිණි.අකුරැස්ස, හේනෙගම විසූ දොන් හෙන්ද්‍රික් සිටුගේ අප්පුහාමි උපාසක මහතා රුවන්වැලි සෑයේ පරතිසංස්කරණ කටයුතු සඳහා කළ අති විශාල වූ එම පරිත්‍යාගය පිළිබඳව එම පින් බිම පුරා තැන තැන සවිකැර තිබූ ශබ්ද විකාශන යන්තර හරහා එවෙලේ පටන් පසු දින තෙක් සිය වරක් පරචාරය විය. එසේම පසුදින හිමිදිරියේ අටසිල් පවාරණවී සිය සුපුරුදු අත් දිග මේස් බැනියමෙන් හා කළු කබායෙන් සැරසුණු ඔහුගේ සේයාරුවක් විශේෂයෙන්ම එහි ගෙන්වන ලද ඡායාරූප ශිල්පියකු ලවා ලබා ගැනීමට එහි නිලධාරීහු කටයුතු කළහ. මෙම ලිපිය සමග පළ කැර ඇත්තේ එදා ගන්නා ලදුව අදද අටමස්ථාන කාර්යාලයේ තැන්පත් කැර ඇති එම දැවැන්ත සේයාරුවේ කුඩා පිටපතකි.


**1912 වසරේදී රුපියල් ලක්‍ෂ දෙකහමාරක් යනු අද කාලයේ නම් මිලියන ගණනාවකි. මන්ද? එම වකවානුවේ කම්කරුවෙකුගේ දෛනික වැටුප වූ කලී ශත 5ක් බැවිනි.**

අකුරැස්ස, පරදුව ගරාමයේ උපත ලද දොන් හෙන්ද්‍රික් සිටුගේ නම්වූ හෙතෙම ළමාවිය ඉක්මවීමත් සමගම එකල "පුංචි එංගලන්තය" නමින් විරුදාවලි ලැබ තිබූ දෙනියාය තේ වතු අධිරාජ්‍යයේ පිහිටි තානායමේ සහකාර කෝකියකු ලෙසින් සේවයට බැඳුණේය. දිනෙන් දින පොහොසත්වූ මේ උත්සාහවන්ත තරුණයා පසුව හේනේගම, ගොරගොඩ යන ගම්මාන වලින් ඉඩම් අක්කර සිය ගණනක් මිලයට ගැනීමට සමත්විය. එම ඉඩම් වල තේ වගාකළ හෙගෙම තේ වත්තෙ අප්පුහාමි යන නමින් පරසිද්ධ විය. අකුරැස්ස පරදේශයේ තේ වගා කිරීමේ ආදි කර්තෘවරයා අප ලිපියේ කථානායක දොන් හෙන්ද්‍රික් විය.

අප ලිපියේ කථානායක දොන් හෙන්ද්‍රික් අප්පුහාමි යටකී 1912 වසරේදී රුවන්වැලි සෑයට රුපියල් දෙලක්‍ෂ පනස් දහසක් පරිත්‍යාග කිරීමෙන් පසුව දොන් හෙන්ද්‍රික් සිල්වා සිටුගේ නමින් පරසිද්ධ විය.  ඒ දැවැන්ත පරිත්‍යාගයට කෘතවේදී වෙමින් ඔහුට ශ්‍රී මහා බෝධි අංකුර දෙකක් ත්‍යාග වශයෙන් පරිත්‍යාග කැරිණි. ඔහු ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමන්ගේ පරධානත්වයෙන් අලි ඇතුන් සහිත මහා පෙරහරකින් එම බෝධීන් වහන්සේලා අකුරැස්සට වැඩමවාගෙන විත් අකුරැස්සේ තෙපුදෙණිය හා කියාඬුව යන ගම්මානවල තමන්ට අයත් ඉඩම් දෙකක රෝපණය කළේය.

කම්කරුවකුගේ දෛනික වැටුප ශත 05ක් වූ 1912 වසරේදී රුවන්වැලි සෑයට රුපියල් ලක්‍ෂ දෙකහමාරක් පරිත්‍යාග කළ මෙම ශ්‍රේෂ්ඨ පුරුෂයා සතුව තිබූ අක්කර දහස් ගණන් වූ ඉඩම්වල අද දස දහස් සංඛ්‍යාත ජනතාවක් නිවෙස් තනාගෙන ජීවත් වෙති. එසේම අකුරැස්ස රෝහල ඇතුළු රාජ්‍ය ආයතන ගණනාවක් පිහිටුවා ඇත්තේ එකී ඉඩම්වලය.

sinhalaebooks.com



sinhalaebooks.com



sinhalaebooks.com




sinhalaebooks.com



sinhalaebooks.com



sinhalaebooks.com



ලක්ෂයකට අධික ජනකායක්
1940 ජුනි 18
අනුරාධපුරයට රැස්වූ බව
වාර්තා වී ඇත.

ශ්‍රද්ධා භක්තියෙන් ඔද වැඩී
ගිය ලක්ෂයකට අධික
ජනකායකගේ මුවින් නිකුත්
වන අඛණ්ඩ සාධු නාදයෙන් ද
මඟුල් බෙර, හේවෙසි,
තම්මැට්ටම් කාහල ඈ
නොයෙක් තූර්ය නාදයෙන් ද
වරින් වර නිකුත්වන්ට වත්
ආචාර වෙඩි මුර නාදයෙන් ද
ශුද්ධ නුවර ගහන තලය රැව්
පිළිරැව් දෙන්නට වන් පෙ.ව.
8.50ට ස්වර්ණමාලි මහා
චෛත්‍යරාජයාගේ
ස්වර්ණාලේපයෙන් බබළන
කොතේ රාජයා මුදුනත චූඩා
මාණී රත්නය පැලඳවීමෙන්
මහා සෑයේ අභිෂේක මංගලය
සිදු කරන ලදී.

sinhalaebooks.com

## උපුටා ගැනීම

මහ වන මැද නට-බුන් වුණු මහා සෑය ගොඩනැගූ හැටි සිළුමිණ පුවත්පත 30 ජුනි, 2018

දුටු-ගැ-මුණු නිරි-ඳුන්ගේ මහා පෞරු-ෂය පෙන්වා මහා සෑය යළි ගොඩ-නැගූ මහා යති-ව-ර-යාණෝ සිළුමිණ පුවත්පත 24 අගෝස්තු, 2019

සුමනසාර හිමියන්ගේ විස්මිත උත්සාහය ගැන ගෙග්‍රරි ආණ්ඩුකාරයාගෙන් බ්‍රිතාන්‍යයට වාර්තාවක් සිළුමිණ පුවත්පත 21 ජූලි, 2018

දිවයින බදාදා අතිරේකයේ 2015 නොවැම්බර් මස 11 වනදාය.

රුවන්මැලිය යළි ගොඩනැගූ පරපුරේ රස කතා ලිපි පෙළ දිවයින පුවත්පත

අතිපූජ්‍ය රේරුකානේ චන්දවිමල මහනාහිමියන්ගේ චූඩාමාණික්‍ය වර්ණනාව

පූජ්‍ය තිරාණගම රතනසාර හිමියන්ගේ තිස්සමහාරාමය

බ්‍රහ්මචාරී වලිසිංහ හරිශ්චන්ද්‍රතුමාගේ සිතියම් සහිත පුරාවිද්‍යාව

මහාචාර්ය උක්කු බණ්ඩා කරුණානන්දගේ අනුරාධපුර අටමස්ථානය හා නුවරකලාවිය

ඇතුළු අන්තර්ජාල මූලාශ්‍රය කීපයක්

**පිරිසිදු ධර්ම දානයකි. ලාභ ලැබීම් පරමාර්ථයෙන් සකසන නොලදී.**

පැරණි පින්තූර අනුව උපකල්පනය කර අඳින ලද චිත්‍රයක් හෙයින් සැබෑ වර්ණ මීට වෙන්සය. වඩාත් සත්‍ය දර්ශනය නැරඹීමට නියම කළු සුදු රූප ඇසුරු කරන්න. කළු සුදු පින්තූර වල අයිතිය අපි සතු නැත. බෝහෝ වෙහෙස මන්සිවී අතීත්යේ පින්තූර ගත් කලාකරුවන්ටද ඒවා අන්තර්ජාලයේ විවිධ ස්ථාන වල සංරක්ෂනය කරන අයටද මේ සියලු පින අත්වේවා!

dhammadana3200@gmail.com | path.nirvana@gmail.com

